2/20

# සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

## 01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : සත්ව නිෂ්පාදන හා සෞඛ්‍යයොමු අංකය :DAPH/AD/8/7/1 දිනය :2013.02.07

1.2 අමාත්‍යාංශය :පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන
යොමු අංකය :MLRCD/05/08/01-02 දිනය :2013.12.02

1.3 කළමණාකරන සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරම

| | | |
|---|---|---|
| යොමු අංකය : | DMS/G3/6/1 | දිනය : 2012.02.24 |
| | DMS/G3/6/1/T | 2012.08.16 |
| | DMS/G3/6/1/T | 2013.04.19 |
| | DMS/G3/6/1/T | 2013.05.31 |
| | DMS/G3/6/1/Vol-2 | 2013.09.13 |

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය
යොමු අංකය : -EST/2/RECRU/02/0220 දිනය :2012.04.04

1.5 වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය යොමු අංකය : -NSCC/3/6/1-SR-1 දිනය :2010.09.08

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය යොමු අංකය : -PSC/EST/3/1/66/2012 දිනය : 2013.11.21

## 02. පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර

2:1 පුහුණු කිරීමේ සේවය. **III** . II. I ශ්‍රේණිය. - රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

## 03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික)

ද්විතීය මට්ටම

3.2 ශ්‍රේණි : පුහුණු කිරීමේ ශ්‍රේණිය.
I ශ්‍රේණිය ,
II ශ්‍රේණිය ,
**III** ශ්‍රේණිය.

3.3 පැවැරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :
ආයතනයන්හි විධායකයේ කාර්යයන්ට උපස්ථම්භක වනසේ විධායකය විසින් නිශ්චිත කොට පවරනු ලබන කාර්යයන් ඇතුලත් බහුකාර්ය ස්වරූපයේ කාර්යයන් ඉටු කරන නිලධර ගණයකි.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර,මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

## 04. තනතුරේ ස්වභාවය : ස්ථිර , විශ්‍රාම වැටුප් සහිතය.

## 05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : MN-03-2006A

5.2 වැටුප් පරිමාණය : MN-03-2006A

රු.15005-4x180-6x240-11x320-20x360-27885

සැලසුම් ශිල්පි (පුහුණු කිරීමේ ශ්‍රේණිය )

රු.12920- 1 x120 -13040

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය ( රු.) |
|---|---|---|
| I ශ්‍රේණිය | පියවර 23 | රු.21,045 |
| II ශ්‍රේණිය | පියවර 12 | රු.17,485 |
| III ශ්‍රේණිය | පියවර 01 | රු.15,005 |

5.4 පුහුණු කිරීමේ ශ්‍රේණියේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006(II) අනුව දීමනාව :-රු.12,920.00

**06. නිලධර ගණයට අයත් තනතුර / තනතුරු**

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාමය | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| පර්යේෂණ සහකාර, | III | 70 | රසායනාගාර උපකරණ පාලනය හා නඩත්තුව පර්යේෂණ සතුන් පාලනය,<br>රසායනාගාර භාණ්ඩ තොග පොත් පවත්වා ගෙනයාම,<br>ජීව විද්‍යාත්මක සාම්පල විශ්ලේෂණය,<br>රෝග විමර්ශන කටයුතු වලට සහාය වීම,<br>සත්ව හා කුකුල් එන්නත් නිෂ්පාදන හා තත්ව පාලන කටයුතු වලදී ශිල්පීය සහාය ලබා දීම,<br>පර්යේෂණ ව්‍යාපෘති වලට අදාල රසායනාගාර හා ක්ෂේත්‍ර රාජකාරි,<br>පශු පර්යේෂණ ආයතනයේ හා පශු විමර්ශන මධ්‍යස්ථානවල පර්යේෂණ හා අදාල සේවාවන්ට අයත් වෙනත් රාජකාරි. |
| සැලසුම් ශිල්පි | පුහුණු | 01 | දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු විසින් සටහන් කර දෙන නිර්මාණ සැළසුම් පිළියෙල කිරීම. |
| තාක්ෂණ නිලධාරි | III | 01 | ගොඩනැගිලි නිර්මාණ සැලසුම් කිරීම. වැඩ පරීක්ෂා කිරීම.<br><br>වැඩ බිම් පාලනය හා සේවා නඩත්තුව |
| පශුසම්පත් සංවර්ධන නිලධාරි | III | 59 | සත්ත්ව පාලන ක්ෂේත්‍රයේ ව්‍යාප්ති කටයුතු අභිජනන කටයුතු ලෙඩ රෝග පිළිබඳව සහ නිරෝධායන කටයුතු- වලදී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින්ට සහාය වීම.<br><br>තනතුරට අදාලව ආයතන ප්‍රධානීන් විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

පර්යේෂණ සහකාර - 70
තාක්ෂණ නිලධාරි - 01
සැලසුම් ශිල්පි - 01
පශු සම්පත් සංවර්ධන නිලධාරි - 59

5/20

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

### 7.1 බඳවා ගන්නා අනුපාතය :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 70 % |
| සීමිත . | 30 % |
| කුසලතා | අදාළ නොවේ |

**සටහන**

I III,II,I යන ශ්‍රේණියන්හි ඒකාබද්ධ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු තනතුරු ප්‍රමාණයෙන් 70% ක් බාහිර අයදුම්කරුවන් සඳහා වන විවෘත තරග විභාගයකින් සම්පූර්ණ කෙරේ.

II සීමිත තරග විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තුව /අමාත්‍යාංශය තුල නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරග විභාගය මගින්ම තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කර ගත හැකිය.

III පුරප්පාඩු සංඛ්‍යාව 3 ට අඩුනම් බඳවා ගනු ලබන්නේ විවෘත ධාරාව යටතේ පමණි.

### 7.2 විවෘත බඳවා ගැනීම :

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : පර්යේෂණ සහකාර,තාක්ෂණ නිලධාරී , පශු සම්පත් සංවර්ධන නිලධාරී **III** ශ්‍රේණිය.

සැළසුම් ශිල්පී :පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය)

:

| 7.2.2 | තනතුර | 7:2:2:1 අධ්‍යාපන සුදුසුකම් | 7:2:2:2 වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|
| සුදුසුකම් වගුව | පර්යේෂණ සහකාර/පශු සම්පත් සංවර්ධන නිලධාරි | රසායන විද්‍යාව,කෘෂිකර්ම විද්‍යාව හා ජීව විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ගණිත විෂය ධාරාවන්ට අයත් විෂයයන් තුනකින් අ.පො.ස.(උ.පෙළ) විභාගය එකවර සමත්වීම.<br>සහ<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසිභාෂාව,විද්‍යාව,ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින්(06)අධ්‍යයන පොදු සහතික පත්‍ර(සාමාන්‍ය පෙළ)විභාගය සමත්ව තිබීම. | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑවුරුදු සත්ව පාලන ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.<br>හෝ<br>සත්ත්ව පාලන ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ)6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.<br>හෝ<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

| | | | |
|---|---|---|---|
| | තාක්ෂණ නිලධාරි | ව්‍යවහාරික ගණිතය,ශුද්ධ ගණිතය,රසායන විද්‍යාව,භෞතික විද්‍යාව,සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා /ගණිත විෂය ධාරාවන්ට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ.) විභාගය එකවර සමත්වීම.<br>සහ<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් ව තිබීම | මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු (සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා) ඩිප්ලෝමාව<br>හෝ<br>අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු (සිවිල් ඉංජිනේරු ක්ෂෙත්‍රය සඳහා) ඩිප්ලෝමාව<br>හෝ<br>ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝම<br>හෝ<br>ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස (සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා) සාර්ථකව සම්පූර්ණ කිරිම<br>හෝ<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනිමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබිම. |
| | සැලසුම් ශිල්පී | සංයුක්ත ගණිතය භෞතිකවිද්‍යාව,රසායන විද්‍යාව, යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා /ගණිත විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත්වීම.<br>සහ<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06)අධ්‍යයන පොදු සහතික පත්‍ර (සමාන්‍ය පෙළ )විභාගය සමත්ව තිබීම. | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවු ; පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම.<br>හෝ<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

6/70

7.2.2.3 පළපුරුද්ද : අදාල නොවේ.

7.2.2.4 කායික සුදුසුකම් :

මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු අතර, මනා ශරීර සෞඛ්‍ය තත්වය වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සනාථ විය යුතුය.

7.2.2.5 වෙනත් :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියළු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේනම් පමණි.

7.2.3 වයස

7.2.3.1අවම සීමාව : වයස අවු. 18 ට නොඅඩු විය යුතුය.

7.2.3.2 උපරිම සීමාව :- වයස අවු. 30 ට නොවැඩි විය යුතුය.

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| 02. පොදු පරීක්ෂණය(භාෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | 100 | 40 |

( විභාගයේ විෂය නිර්දේශය හා තේරීම් පරිපාටිය උපලේඛන 01 හි දැක්වේ )

7.2.4.1.1 පවත්වන බලධාරියා : විභාග කොමසාරිස් ජනරාල් හෝ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්.

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ.

7.2.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ

7.2.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ)

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණ: අයදුම්කරුවන්ගේ සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ ලියවිලි හා සහතික පත් පරීක්ෂා කර බැලීම.

7.2.4.4.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වේ.

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පලකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ .

7.3 සීමිත බඳවා ගැනීම් :

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය :පර්යේෂසහකාර/ පශු සම්පත් සංවර්ධන නිලධාරි : III ශ්‍රේණිය.

7.3.2 සුදුසුකම් :

| තනතුර | 7:3:2:1 අධ්‍යාපන සුදුසුකම් |
|---|---|
| පර්යේෂණ සහකාර /පශු සම්පත් සංවර්ධන නිලධාරී | රසායන විද්‍යාව ,කෘෂිකර්ම විද්‍යාව හා ජීව විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ගණිත විෂය ධාරාවන්ට අයත් විෂයයන් තුනකින් අ.පො.ස.(උ.පෙළ) විභාගය එකවර සමත්වීම.<br>සහ.<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ,විද්‍යාව,ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06)අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ)විභාගය සමත්ව තිබීම. |

7.3.2.2 වෘත්තිය සුදුසුකම්

| තනතුරු | වෘත්තීය සුදුසුකම් |
|---|---|
| පර්යේෂණ සහකාර /පශු සම්පත් සංවර්ධන නිලධාරී | තෘතියික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑවුරුදු සත්ත්ව පාලන ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.<br>හෝ<br>සත්ත්ව පාලන ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ)6මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම<br>හෝ<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

7.3.2.3 පළපුරුද්ද :-

| තනතුරු | පළපුරුද්ද |
|---|---|
| පර්යේෂණ සහකාර/පශු සම්පත් සංවර්ධන නිලධාරී | ප්‍රාථමික ශිල්පීය නොවන හෝ ඉන් ඉහල සේවා ගණයක දෙපාර්තමේන්තුගත ස්ථිර තනතුරක අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර පහ(05)ක පළපුරුද්දක් ලබා තිබීම. |

7.3.2.4 කායික සුදුසුකම් :

ශ්‍රී ලංකාව තුල ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත් :

I පත්වීම ස්ථිර කර තිබීම

II නියමිත දිනට පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

III සේවයට බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ නිලධාරියා සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේනම් පමණි.

7.3.3 වයස : අදාල නොවේ.

7.3.4. බඳවා ගැනීමේ ක්‍රමය :
ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

7.3.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| විෂයානු බද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40% |

( විෂය නිර්දේශය උප ලේඛන 2 මගින් දැක්වේ. )

7.3.4.1.1. පවත්වන බලධාරියා ; විභාග කොමසාරිස් ජනරාල් හෝ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්.

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ.

7.3.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ.

7.3.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු :ලකුණු ලබා නොදෙන අතර,සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

7.3.4.4.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධාරියා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වේ.

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : අභ්‍යන්තරව පළ කරනු ලබන ප්‍රසිද්ධ දැන්වීමක් මගින් හා වෙබ් අඩවියේ පළ කිරීම මගින්.

**7.5 කුසලතා මත බඳවා ගැනීම: අදාල නොවේ.**

**7.6 පුහුණුව අවසානයේ බඳවා ගැනීමේ ක්‍රමය :- පුහුණුවීම් ශ්‍රේණියේ එක් වසරක න්‍යායාත්මක ප්‍රයෝගික පුහුණුවෙන් පසු වසර අවසානයේ පවත්වනු ලබන විභාගයේ ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදුකෙරේ(විෂය නිර්දේශය උපලේඛන 6 හි දැක්වේ.)සැළසුම් ශිල්පී තනතුර සඳහා අදාලවේ.**

**08. කාර්යක්ෂමතා කඩඉම්: "ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය".**

**09. ~~රාජ්‍ය~~ භාෂා ප්‍රවීණතාව**

9.1

| ශ්‍රේණිය | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මධ්‍යයකින් සේවයට බැඳුණු සේවකයින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 හා ඊට අනුපාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීනතාව ලබා ගත යුතුය. |

**10. ශ්‍රේණි උසස් කිරීම්: "ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය".**

**සටහන : 1 වන හා 2 වන දෙපාර්තමේන්තු පරීක්ෂණ සඳහා අදාළ වන විෂයය නිර්දේශයන් ඇමුණුම 4 හා ඇමුණුම 5 මගින් දක්වා ඇත.**

11. තනතුරු වලට පත් කිරීම : අදාල නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : මෙම බඳවා ගැනීම් පරිපාටියෙහි සඳහන් කොන්දේසි වලට අමතරව ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවෙහි සඳහන් විධිවිධාන සහ කොන්දේසිද අදාළ වේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපන :
"සක්‍රීය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලයවේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය:- ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව වේ.

15 සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධි විධාන අදාලවේ.

16 මෙම බඳවා ගැනීම් පරිපාටියේ විධි විධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කලේ : අත්සන :...................... පූර්ක්ෂා කලේ : අත්සන ...............................
(විෂයය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා) (විෂයය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම : නම :
තනතුර : තනතුර :
දිනය : 2014.02.28 දිනය : 2014.03.03

නිර්දේශ කර ඉදිරිපත් කරමි.
අත්සන :.........................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම :
තනතුර :
දිනය : 2014.03.05
නිල මුද්‍රාව:

යොමු අංකය : MLRCD/CS/08/01-02

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ , සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පර්යේෂණ සහකාර තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..............................
නම : ..............................
ලේකම්,
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය.

දිනය : 12.3.2014 නිල මුද්‍රාව

යොමු අංකය : PSC/EST/3/1/166/2012

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ , සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පර්යේෂණ සහකාර තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2013-11-21 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන : ..............................
නම : ..............................

ලේකම්,රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

දිනය : 2014 05 22 නිල මුද්‍රාව

ඩී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට
කොළඹ-05.

10/20

විභාග පිළිබඳ ආකෘතිය

උපලේඛනය 01

01. විභාගයේ නම :-සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ශ්‍රේණියේ III ශ්‍රේණියට බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය.

02. විභාගය පිළිබඳ විස්තර :- ලිඛිත පරීක්ෂණයකි.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 02. පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානු බුද්ධිපරීක්ෂණය) | පැය 01 | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා, විභාග කොමසාරිස් ජනරාල් වේ.

04. විභාගය පවත්වනු ලබන්නේ තනතුරෙහි පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලබන අවස්ථාවන්හිදීය . විභාගය සිංහලෙන් ,දෙමළෙන් හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයෙකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයත්,තීරණය කිරීමේ ශක්තියත්,විනිශ්වය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය. |
| 02. පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානු බද්ධ පරීක්ෂණය) | <u>පර්යේෂණ සහකාර තනතුර සඳහා</u><br><br>පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.<br>1. රසායනාගාර උපකරණ හඳුනාගැනීම හා නඩත්තුව<br>2. රෝග විනිශ්වය සඳහා යොදා ගන්නා පරීක්ෂණ ක්‍රම. (ව්‍යාධි වේද,පරපෝෂිත වේද,ක්ෂුද්‍ර ජීවී වේද, මස්තු වේද, පෝෂණ )<br>3. තත්ත්ව පාලනය සඳහා යොදාගන්නා පරීක්ෂණ ක්‍රම (භෞතික පරීක්ෂණ, රසායනික පරීක්ෂණ,සංවේදිතා පරීක්ෂණ)<br>4. රසායනාගාර පවිත්‍රතාව, විෂබීජහරණය<br>5. සාම්පල ලබාගැනීම, ගබඩා කිරීම,ප්‍රවාහනය<br><br><u>තාක්ෂණ නිලධාරි සඳහා</u><br><br><u>පහත සඳහන් විෂයයන් ගෙන් සමන්විත ප්‍රශ්ණ පත්‍රයකි.</u><br>1. මැනීම සහ මට්ටම් ගැනීම - දම්වැල් ගැනීම. මට්ටම් ගැනීම.තියොබලයිටුව භාවිතය පිළිබඳ සහ තල මේස මැනුම් පිළිබඳව දැනුම<br>2.ගොඩනැගිලි ද්‍රව්‍ය - සිමෙන්ති හුණු,වැලි. ගල් තීන්ත වර්ග . වාර්නිෂ් වර්ග ප්ලාස්ටික් සහ වීදුරු. ගොඩනැගිලි ද්‍රව්‍ය වශයෙන් යොදා ගනු ලබන . හොඳ තත්වයේ දැව හඳුනා ගැනීමේ දැනුම<br><br>3. ගොඩනැගිලි ඉදි කිරීම සහ ඇස්තමේන්තු පිළියෙල කිරීම අත්තිවාරම් බිත්ති බැඳීම .දැව වහලය. යකඩ තාප්ප.කුළුණු,කොන්ක්‍රීට් තලාද සහ කොන්ක්‍රීට් කුළුණු /අත්තිවාරම්/තට්ටු/තරප්පු ආදිය යොදනු ලබන ආකාරය සහ යොදනු ලබන අවස්ථා මිනුම් ලබා ගැනීම. ඇස්තමේන්තු පිළියෙල කිරීම ඉදි කිරීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රමාණයන් සහ කම්කරුවන් සංඛ්‍යාව ඇස්තමේන්තු කිරීම<br>4. ව්‍යුහ නම්‍යතා/ව්‍යාපෘති බල සටහන<br>5. සේවාවන් - විදුලි.ජල සනීපාරක්ෂක<br><br><u>සැලසුම් ශිල්පි (පුහුණුවීම් ශ්‍රේණිය සඳහා)</u><br><br><u>පහත සඳහන් විෂයයන් ගෙන් සමන්විත ප්‍රශ්ණ පත්‍රයකි.</u><br><br>1. ගණිතය - ගණිතමය දැනුම පිළිබඳ මූලික සිද්ධාන්ත හා ක්‍රියාවලි<br>• මෙට්‍රික් ඒකක. සම්මත ඒකක පරිවර්තනය<br>• දිග.වර්ග ඵලය. පරිමාව ධාරිතාවය පිළිබඳ මිනුම් ගැනීම<br>• සාමාන්‍ය ප්‍රතිශත අගය ගණනය කිරීම<br>• සෘජු රේඛා දී ඇති සංඛ්‍යාවකට අදාලව සමාන හෝ දෙකක් හෝ දෙකකට වැඩි කොටස් බවට පත් කිරීම |

| | |
|---|---|
| | 2. ප්‍රමාණ ගැනීම<br><br>ආදර්ශ සැලසුම්වලින් සපයනු ලබන ගොඩනැගිලි හා වෙනත් සරල ව්‍යුහ වලට අදාල ප්‍රමාණ ගැනීම<br><br>3. මූලික ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු හා නඩත්තු<br>• අත්තිවාරම්. බිත්ති. ව්‍යුහ කොටස් .වහලය .සිලිම .දොර හා ජනේල. බිම හා බිත්ති නිමවුම් කටයුතු සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් වලදී භාවිතා කරන අමු ද්‍රව්‍ය<br>• වැඩ බිම් කළමනාකරණයේ තත්තව පාලනය<br>• වැඩබිම් කාර්යාලයේ සිට පවත්වා ගෙන යා යුතු ලිපි ලේඛණ<br><br>4. ජල සම්පාදන හා ජල ප්‍රවාහන<br>• ජල සම්පාදන<br>○ ජල මූලාශ්‍ර<br>○ ජල නල අමුද්‍රව්‍ය සහ භාවිත කරන උපාංග<br>○ සියළු අත්‍යාවශ්‍ය උපාංග ඇතුලත් නල එලීම<br>• පල්දෝරු/ ජල ප්‍රවාහන -<br>○ රෙගුලාසි<br>○ ජල ප්‍රවාහන උපාංග. වැසිකිළි පෝච්චි. උගුල. ගලි. චාතාශ්‍රය. මනුවල වල් හා වෙනත් අංග බැහැර කිරීම දක්වා |
| පශු සම්පත්<br>සංවර්ධන නිලධාරි | පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.<br><br>01ශ්‍රී ලංකා කෘෂිකාර්මික හා සත්ව පාලන කටයුතු පිළිබඳ පවත්නා සම්පත්, විභවයන් වර්තමාන තත්වයන් හා ආර්ථිකයට ඇති දායකත්වය<br>02.ශ්‍රී ලංකාවේ සත්ත්ව නිෂ්පාදන රටා, නිෂ්පාදන ප්‍රමාණයන්.හා අලෙවිකරන ක්‍රම, ශ්‍රී ලංකාවේ පවතින සත්ත්ව ගොවිපල රටා, ඒවායේ පිහිටීම හා විසිරීම<br>03.ගොවිපල සතුන් අභිජනනය සඳහා බහුලව යොදාගන්නා ක්‍රම<br>04.බෝවෙන සත්ව රෝග මර්ධන ක්‍රියා පිළිවෙත්, රෝගී සතුන්ගේ නියැදි රැස් කිරීම හා ප්‍රවාහනය<br>05.ඒකාබද්ධ ගොවිපල් ක්‍රම හා ප්‍රතිචක්‍රියකරණ ක්‍රම<br>06.සත්ත්ව පාලනය හා ආශ්‍රිත කර්මාන්ත කිරි සැකසීම, මස් සැකසීම, සත්ත්ව ආහාර නිෂ්පාදනය<br>07.සත්ත්ව නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ ආදායම් වියදම් ගණනය ක්‍රම, ගොවිපල් වාර්තාකරණය හා ගිණුම් විශලේෂණය, සත්ත්ව ගොවිපල් සැලසුම්කරණය.<br>08.විද්‍යාත්මක තොරතුරු ප්‍රචාරණය ක්‍රම භාවිතය හා ඒවායේ ඵලදායිතාවයන් |

06. තේරීම් පරිපාටිය :-

මෙම විභාගයෙන් සුදුසුකම් ලැබූවන්ගෙන් වැඩිම ලකුණු ප්‍රමාණය ලත් අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් පරීක්ෂා කර බලනු ලැබේ.සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ. සුදුසුකම් සම්පූර්ණ කර ඇත්තාවූත්, විෂයයන් දෙකින්ම උපරම ලකුණු ගත්තාවූත් අපේක්ෂකයින් III වන පන්තියට පත් කිරීම සඳහා තෝරාගනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පහත දැක්වෙන නිලධාරීන්ගෙන් සමන්විත වනු ඇත.

01. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සභාපති)
02. අධ්‍යක්ෂ (පශු පර්යේෂණ) (සාමාජික)
03. අධ්‍යක්ෂ (පරිපාලන) (සාමාජික)
04. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ නියෝජිතයෙක් (සාමාජික)

සකස් කළේ :
අත්සන :..............................
නම :..............................
තනතුර :..............................
දිනය : 2014.01.29

පරීක්ෂා කළේ
අත්සන :..............................
නම :..............................
තනතුර :..............................
දිනය : 2014.1.30

අත්සන :..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)
නම :..............................
තනතුර :..............................
දිනය : 30/1/14
නිල මුද්‍රාව :..............................

උපලේඛනය 02

විභාග පිළිබඳ ආකෘතිය

01. විභාගයේ නම :- **:-සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ III ශ්‍රේණියට අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේ විභාගය.**

02. විභාගය පිළිබඳ විස්තර :- ලිඛිත පරීක්ෂණයකි.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 02. තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | පැය 03 | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා, විභාග කොමසාරිස් ජනරාල්

04. විභාගය පවත්වනු ලබන්නේ තනතුරෙහි පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලබන අවස්ථාවන්හිදීය.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයත්,තීරණය කිරීමේ ශක්තියත්,විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය. |
| 02. තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | <u>**පර්යේෂණ සහකාර**</u><br><br>මෙම ප්‍රශ්න පත්‍රය එක් කොටසකින් ප්‍රශ්න හතර බැගින් වූ කොටස් තුනකින් සමන්විතය. සෑම කොටසකින්ම ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන සම්පූර්ණ ප්‍රශ්න 06 කට පිළිතුරු සැපයිය යුතුය.<br><br><u>**පළමුවන කොටස**</u><br><br>*පහත සඳහන් උපකරණ රසායනාගාරයේදී භාවිතා කිරීම,විද්‍යාත්මක හා නිරවද්‍ය ලෙස උපයෝගී කරගැනීම පිළිබඳ මූලික දැනුම.<br><br>විශ්ලේෂණ තුලාව (Analytical Balance),<br>සාමාන්‍ය තුලාව(General Purpose Balance),<br>කේන්ද්‍රාපසාර උපකරණය (Centrifuge) , පීඩතාපකය(Autoclave),<br>ඩීඅයිනයිසර (deionizer), ඉන්කියුබේටරය(Incubator)<br>අධිශීතකරණය(Deepfreezer), අන්වීක්ෂය(Microcoscope),<br>උඳුන් (Oven), පී.එච්.මීටරය (pH Meeter)<br>ආශ්‍රැත ජලය ලබා ගන්නා උපකරණය (Distilling apparatus)<br>ජීවානුහාරකය (Sterilizer) ශිතකරණය (Refrigirator)<br>ජෛවාරක්ෂක කැබිනට්ටුව (Bio Safty Cabinet)<br>බන්සන් දාහකය හා තෙපාව<br><br>*රසායනාගාරයේදී බහුල වශයෙන් භාවිතයට ගනු ලබන භාජන වල උපයෝගීතාවයන්<br>(Use of common items of laboratory ware)<br>උදා :- බීකර ,මිනුම්සාර,පිපෙට්ටු,බයිරෙට්ටු ,කැකෑරුම් නල (Boiling Tubes) වට අඩි ප්ලාස්කු (Conical Flask) පරීක්ෂා නල (Test Tubes) කේන්ද්‍රාපසරණ නල (Centrifuge Tubes)<br><br>*රසායනාගාරයේදී භාවිතයට ගනු ලබන රසායනික,ජෛව රසායනික හා ප්‍රතිකාරක ද්‍රව්‍ය වලින් සිදුවිය හැකි ආපදාවන් (Hazards) මෙන්ම ඒවා ගබඩා කිරීමේදී දැක්විය යුතු උපචාරයන් - මේ යටතේ එවැනි ද්‍රව්‍ය කාමර උෂ්ණත්වයේ දී ගබඩා කළ හැකිද? ශීතකරණයක තබා ගත යුතුද? ගිනි ගන්නා සුළු බව වැනි එක් එක් ද්‍රව්‍ය සතු විශේෂ ගුණාංග පිළිබඳ සරල අවබෝධයක් භාවිතයේදී පිළිකා ජනක, විකිරණශීලි ද්‍රව්‍ය ලෙස ක්‍රියාකරණ හානිකර ද්‍රව්‍ය හඳුනාගැනීමට ඇති හැකියාව.<br><br>*රසායනාගාරයක් තුළ රාජකාර් කටයුතු කිරීමේදී පිළිපැදිය යුතු කරුණු (විස්තර කරන්න<br><br><u>**දෙවන කොටස**</u><br>රසායනාගාරයේ කටයුතු වලදී භාවිතා කරන වීදුරු භාජන සේදීම සඳහා විෂබීජනාශක හා ප්‍රතිපූතක ද්‍රව්‍ය (Antiseptic and disinfectant) වල භාවිතය.<br>1.ක්ෂුද්‍ර ජීව විද්‍යාවට අයත් ශාඛාණු හා විෂාණු විද්‍යා පරීක්ෂණ කටයුතු වලට |

අවශ්‍යවන විදුරු භාජන සේදීමේ ක්‍රම,වරක් පාවිච්චි කරන ලද බැක්ටීරියා රෝපිත අඩංගු පෙට්‍රි දීසි (Petridishes) නැවත භාවිතයට හැකිවන සේ සකස්කර ගැනිමේ පියවර.

2. ඛනිජ විශ්ලේශණය සඳහා විදුරු භාණ්ඩ පිළියෙල කිරම. මෙහිදී අනුගමනය කළ යුතු විධිමත් ක්‍රියා පිළිවෙළ.

3. ජීවානුහරණ ක්‍රම හා ඒවාට පදනම් වූ විද්‍යාත්මක මූලධර්ම. (Sterilization Methods) ජීවානුහරණ ක්‍රම වලදී භාවිතාවන අපකරණ පිළිබඳ මූලික දැනීම.

ක්ෂුද්‍ර ජීව විද්‍යාවේදී භාවිතාවන මාධ්‍ය හා ප්‍රතිකාරක ජීවානුහරණය කිරම.

(Sterilization of culture media and regents)

4. රසායනාගාර පර්ක්ෂණ සඳහා සාම්පල ගැනීම හා එකතු කිර්මේදීඅනුගමනය කළයුතු විධිමත් කි්‍රයා පිළිවෙල ( Colletion of Speciments for laboratory tests)

(1) මළ සතුන්ගේ (11) ජීවී සතුන්ගේ (111) පර්භෝජන ද්‍රව්‍ය ලෙස මෙම සාම්පල වර්ග කලහැක.

තවද අරමුණගත පර්ක්ෂාවකට අදාල වන ලෙස නිරවද්‍ය ලෙස සාම්පල ලබා ගැනීම පිළිබඳ අවබෝධය.

එම සාම්පල රසායනාගාරයට යැවීමේ දී අනුගමනය කළ යුතු නිවැරදි උපචාර හා රසායනාගාරයට පර්ක්ෂාවන් සඳහා ගෙන එනු ලබන එම සාම්පල උචිත ලෙස ගබඩා කිර්මේ පිළිවෙළ.

<u>තුන්වන කොටස</u>

- (Blood Agar) මාධ්‍ය පිළියෙල කිරම සඳහා බැටළුවන් / හරකුන් ගෙන් රුධිරය ලබා ගැනීම.
- අන්වීක්ෂීය පර්ක්ෂාව සඳහා ක්ෂුද්‍ර ජීවීන් වර්ණ ගැන්වීම. (Collection of Blood from Sheep/ Cattle for preparation of Blood Agar)
- ක්ෂුද්‍ර ජීවීන් වර්ණ ගැන්වීමෙහි විද්‍යාත්මකවූත් වැදගත්කමකින් යුතු අරමුණු .
- රුධිර පරපෝෂිතයන් පර්ක්ෂා කිරම සඳහා කදා සැකසීම හා සුදුසු වර්ණක භාවිතා කිරම.
- ක්ෂුද්‍ර ජීව විද්‍යාවේදී බැක්ටීරියා හඳුනා ගැනීම හා රෝග විනිශ්චයට උපයෝගී කර ගැනීම සඳහා භාවිතා කරනු ලබන විවිධ රෝපණ ක්‍රම . (Culture Techniques)
- ක්ෂුද්‍ර ජීව විද්‍යාවේදී කෘත්‍රිම මාධ්‍යවල වැදගත්කම . (The Importance of artificial media in microbiology)
- ශ්‍රී ලංකාවේ බහුලව දක්නට ලැබෙන බැක්ටීරියා හා වෛරස ආශ්‍රිතව සතුනට සංක්‍රමණය වන රෝග.
- සත්ව එන්නත්සාර පිළිබඳ මූලික දැනීම.
- සත්ව ආහාර වර්ග පිළිබඳ මූලික දැනීමක්.
- සත්ව ආහාර වල අඩංගු ප්‍රධාන සංඝටක.
- කිර්වල සංයුතිය හා ඒවායේ සංඝටක.
- පස සංරක්ෂණය කිරීම සඳහා තෘණ වගාව උපයෝගී කර ගැනීම.
- සත්ව ආහාරයෙහිලා රනිල වර්ග වල වැදගත්කම.
- පසෙහි ආම්ලිකතාවය හා ජීවිකතාව තෘණ වගාවේදී වැදගත්වන ආකාරය හා පසෙහි ආම්ලිකතාව පිළිබඳ පාලනය.
- ලංකාවේ තිබෙන කුකුළු ප්‍රභේද පිළිබඳ අවබෝධයක්.
- කුකුළන්ට වැළඳෙන රෝග නිවාරණය සඳහා එන්නත්සාර භාවිතය.
- කුකුල් පාලනයේ දී යොදා ගන්නා කුකුල් ආහාර වර්ග.
- විශ්ලේෂණය සඳහා සත්ව ආහාර ද්‍රව්‍ය සකස් කිරම.

| | |
|---|---|
| තාක්ෂණ ප්‍රශ්ණ පත්‍රය | පශු සම්පත් සංවර්ධන නිලධාරී<br>• කාලීන සමාජීය සිදුවීම් පිළිබඳ අවබෝධය මැන බැලීම.<br>• අන්තර්ජාතික සබඳතා පිළිබඳ මූලික දැනුම මැන බැලීම.<br>• පශු සම්පත් සංවර්ධන ක්ෂේත්‍රයේ සිදුව ඇති නව්‍යකරණය පිළිබඳ දැනුම හා ඒ සඳහා වන දිශාභිමුඛ වීම පිළිබඳව මැන බැලීම.<br>• සත්ත්ව පාලන සංවර්ධනය පිළිබඳ දැනුම.<br>• සත්ත්ව පාලකයින්ගේ සංවිධානවල ක්‍රියා කාරීත්වයට ගොවීන් හා ගොවි සමිති සමග කටයුතු කිරීම, මහජන සම්බන්ධතාවය.<br>• සත්ත්ව පාලන සංවර්ධනය පිළිබඳ දැනුම. |

06. තේරීම් පරිපාටිය :-

මෙම විභාගයෙන් සමත්වූවන් අතුරින් විෂයයන් දෙකටම වැඩිම ලකුණු ප්‍රමාණය ලත් අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් පරීක්ෂා කර බලනු ලැබේ.සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ. සුදුසුකම් සම්පූර්ණ කර ඇත්තාවූත්, විෂයයන් දෙකින්ම උපරිම ලකුණු ලබාගෙන ඇත්තාවූත් අපේක්ෂකයින් III වන ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පහත දැක්වෙන නිලධාරීන්ගෙන් සමන්විත වනු ඇත.

01. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සභාපති)
02. අධ්‍යක්ෂ (පශු පර්යේෂණ) (සාමාජික)
03. අධ්‍යක්ෂ (පරිපාලන) (සාමාජික)
04. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ නියෝජිතයෙක් (සාමාජික)

සකස් කළේ :
අත්සන :........................................
නම :........................................
තනතුර :........................................
දිනය : 2014.01.29

පරීක්ෂා කළේ
අත්සන :........................................
නම :........................................
තනතුර :........................................
දිනය : 2014.1.30

අත්සන :........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)
නම :........................................
තනතුර :........................................
දිනය : 30/1/14
නිල මුද්‍රාව :........................................

16/20

උප ලේඛනය 03

**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ නිලධාරීන් I, II ,III ශ්‍රේණි වලට අන්තර්ග්‍රහණය කිරීමේ විධිවිධාන :-**

මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මගින් ලබාදී ඇති MN-03-2006-A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියළු දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.
සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට හෝ ශ්‍රේණියට පත් කරන ලද දිනය **පදනම් කරගෙනය.** කෙසේ **වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන්** අදාල තැනැත්තාගේ **වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක** විය යුතුය. එසේම වැටුප් පරිවර්ථනයේදී අදාල තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 .4 වගන්තිය අනුව ඊලඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

(i) MN-03-III ශ්‍රේණිය
**ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ** II **වන පන්තිය(ආ) ඛණ්ඩයේ සිටින නිලධාරීන්** III **වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.**

(ii) MN-03- II ශ්‍රේණිය
**ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ** II **වන පන්තිය (අ) ඛණ්ඩයේ සිටින නිලධාරීන්** II **වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.**

(iii) MN-3-1 ශ්‍රේණිය
**ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ** I **වන පන්තියේ සිටින නිලධාරීන්** 1 **වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.**

සකස් කළේ : [signature]
අත්සන :...............................................
නම : ...............................................
තනතුර : ...............................................
දිනය : 2014.01.27

පරීක්ෂා කළේ : [signature]
අත්සන : ...............................................
නම : ...............................................
තනතුර : ...............................................
දිනය : 2014.01.30

අත්සන : [signature]
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : ...............................................
තනතුර : ...............................................
දිනය : 30/1/14
නිල මුද්‍රාව : ...............................................

17/20

උප ලේඛනය 04

විභාග පිළිබඳ ආකෘතිය

01. විභාගයේ නම :- **සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ III වන ශ්‍රේණියේ නිලධාරින් සඳහා පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය .**

02. විභාගය පිළිබඳ විස්තර :- ලිඛිත පරීක්ෂණයකි.

| තනතුර | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| පර්යේෂණ සහකාර | 01 සාමාන්‍ය රසායනාගාර ක්‍රම | පැය 01 1/2 | 100 | 40 |
| | 02 විශේෂ විෂයානුබද්ධ පත්‍රය | පැය 011/2 | 100 | 40 |
| තාක්ෂණ නිලධාරි | වෘත්තියට අදාල සාමාන්‍ය දැනුම | පැය 1 1/2 | 100 | 40 |
| | විශේෂ විෂයානුබද්ධ පත්‍රය | පැය 1 1/2 | 100 | 40 |
| සැළසුම් ශිල්පී | පළමු ප්‍රශ්නපත්‍රය | පැය 03 | 100 | 40 |
| පශු සම්පත් සංවර්ධන නිලධාරි | පරිපාලනය. දෙපාර්තමේන්තු රෙගුලාසි. අනපණත් | පැය 1 1/2 | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්.

04. විභාගය අවම වශයෙන් වර්ෂයකට වරක් පවත්වනු ලැබේ.

05. එක් එක් ප්‍රශ්ණ පත්‍රය සඳහා අවම වශයෙන් 40% ක් ලකුණු ලබා ගත යුතුය.

06. විභාගය සඳහා වන විෂය නිර්දේශය :-

| තනතුර | ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශ |
|---|---|---|
| පර්යේෂණ සහකාර | සාමාන්‍ය රසායනාගාර ක්‍රම | 1. සාමාන්‍ය රසායනාගාර උපකරණ<br>2. සාමාන්‍ය රසායනාගාර ක්‍රම<br>3. පර්යේෂණ උපකරණ පරීක්ෂා කිරීම, ජීවානුහරණය කිරීම හා ගබඩා කිරීම<br>4. සාමාන්‍ය පර්යේෂණ ක්‍රම<br>5. විවිධ සත්ත්ව වර්ගවලින් රුධිර මළ හා වෙනත් සාම්පල් ලබා ගැනීම<br>6. රසායනාගාර සතුන් රැක බලා ගැනීම. |
| | විශේෂ විෂයානුබද්ධ පත්‍රය | 1 . ප්‍රජනන ආබාධ ආශ්‍රිත රසායනාගාර පරීක්ෂණ<br>2. පරපෝෂිත විද්‍යාව අශ්‍රිත පරපෝෂිත හඳුනාගැනීම<br>3. ක්ෂුද්‍ර ජීව විද්‍යාව ව්‍යාධි විද්‍යාව ආශ්‍රිත රෝපණ මාධ්‍ය හා පටක මාධ්‍ය වර්ණ ගැන්වීම<br>4. කුකුළු රෝග ආශ්‍රිත සාම්පල රැස්කිරීම<br>5. විෂාණු විද්‍යාව ආශිත සාම්පල් රැස්කිරීම වගා කිරීම හා විශ්ලේෂණය<br>6. කෘතිම සිංචන ආශ්‍රිත ශුක්‍රාණු පරීක්ෂාව. තණුකරණය හා විශ්ලේෂණය කිරීම<br>7. පෝෂණ විද්‍යාව අශ්‍රිත ආහාර සාම්පල් විශ්ලේෂණය ක්‍රම |

| | | |
|---|---|---|
| තාක්ෂණ නිලධාරි | වෘත්තියට අදාල දැනුම | (අ) ගෘහ නිර්මාණ ඇඳීම<br>දී ඇති දත්ත අනුව ගෘහ නිර්මාණ ශිල්ප ක්‍රම උපයෝගී කර ගනිමින් නිර්මාණ ඇඳීම.ප්‍රමාණපත්‍ර සහ ඇස්තමේන්තු පිළියෙල කිරීම.<br>(ආ) බඳු ප්‍රාමාණපත්‍ර හාඇස්තමේන්තුව ගොඩනැගිලි ඉදිරිකිරීමේදී භාවිතා වන ද්‍රව්‍ය ප්‍රමාණ නිර්ණය කිරීම<br>(ඇ) අත්තිවාරම් සවි ගැන්වූ සහ නිමාව ආදිය පිළිබඳ දැනුම<br>.<br>(ඈ) කොන්ක්‍රීට් සාමාන්‍ය හා සවිගැන්වීම, මිශ්‍රණ පිළියෙල කිරීම . මිශ්‍ර කිරීම, පදම් කිරීම, සවි ගැන්වීම, අතුරන අන්දම පිළිබඳ දැනුම.<br>(ඉ) සියලුම ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා භාවිතා කරන උපකරණ සහ ඒවායේ උසස් පහත් බව ප්‍රයෝජන ආදිය පිළිබඳ දැනුම. |
| | විෂයානුබද්ධ පත්‍රය | කොන්ක්‍රීට් සහ වැර ගැන්වීම ,කුළුණු තලාද තට්ටු<br>( i ) අත්තිවාරම්, ආකෘති වැඩ, සවි ගැන්වූ කොන්ක්‍රීට් සිමෙන්ති.<br>(ii ) ගොඩනැගිලි ප්‍රමාණ මිනුම් හා ගොඩනැගිලි කටයුතු සම්බන්ධ ප්‍රමාණපත්‍ර පිළියෙල කිරීමේ දැනුම.<br>(iii) ගොඩනැගිලි සඳහා ජල සැපයුම, විදුලි සැපයුම ආදි සේවාවන් සඳහා සටහන් ඇඳීම පිළිබඳ දැනුම. |
| සැලසුම් ශිල්පී | පළමු ප්‍රශ්නපත්‍රය | 1 ගොඩනැගිලි ඉදිරිකිරීම හා නඩත්තුව<br>❖ පස් වර්ගීකරණය හා භූමි පරීක්ෂාව<br>❖ ගොඩනැගිලි අත්තිවාරම් වර්ග හා භාවිතය<br>❖ තෙත් නිවාරණය.<br>❖ බැමි වර්ග හා භාවිතය-ද්‍රව්‍ය ප්‍රමාණ<br>❖ ගොඩනැගිලි ද්‍රව්‍ය තත්ව පරීක්ෂාව හා පිරිවිතර<br>❖ දැව හා වෙනත් දොර ජනෙල් සිලිම් හා වහල<br>❖ දැව වර්ගීකරණය හා භාවිතය<br>❖ වැද්දුම් හා පිරිවැද්දුම්ක්‍රම<br>❖ වහල රාමු සැකිලි(යකඩ හා දැව)<br>❖ .කොන්ක්‍රීට් මිශ්‍රණ<br>❖ වැරගැන්වුම් . තලාද හා තට්ටු<br>❖ ඇතුරුම් වැඩ හා කපරාරු<br>❖ ගොඩනැගිලි නිමැවුම්<br>❖ නඩත්තු වැඩ<br>2 ප්‍රමාණ ගැනීම හා ඇස්තමේන්තු<br>❖ ගොඩනැගිලි සැලසුම් මගින් ප්‍රමාණ ගැනීම හාඇස්තමේන්තු පිළයෙල කිරීම.<br>❖ සම්මත පිරිවතර හා සම්මත මැණුම ගැනීමේක්‍රම<br>❖ අවශ්‍ය කම්කරු ශ්‍රමය හා ගොඩනැගිලි ද්‍රව්‍ය<br>මූලික බිම මැනීම හා මට්ටම් ගැනීම<br>❖ දම්වැල් මැනුම<br>❖ තලමිතිය - ලෙවලය<br>❖ ලෙවල් පොත හා එහි එක් එක් ක්‍රම වලට පිටු සැකසීම |

<table>
<tr>
<td></td>
<td></td>
<td>4. ජල සම්පාදනය. ජල අපවහනය. හා පල්දෝරු පද්ධති<br>
❖ පයිප්ප වර්ග<br>
❖ මනුවලවල් වර්ග<br>
❖ උගුල් වර්ග<br>
❖ පූතික ටැංකි<br>
❖ ගවර වළ<br>
❖ උරා ගැනීමේ වළ<br>
❖ ජල සැපයුම් . අපවහන හා පල්දෝරු පද්ධතිවලභාවිතා වන උපාංග හා වැල්ව<br>
❖ ජල පිරිපහදු ක්‍රම<br>
❖ පල්දෝරු පිරිපහදුව<br>
<br>
5. විදුලි සැපයුම<br>
❖ විදුලි පරිපථ පිළිබඳ දැනුම<br>
❖ පරිපථ බිඳීනය<br>
❖ විදුලි උපකරණවල ධාරිතාව<br>
❖ ධාරාවට අනුව වයර් තේරීම<br>
❖ අවශ්‍ය ආලෝක ප්‍රමාණය අනුව විදුලි බුබුලු සැකසීම<br>
❖ ඇතුලත. පිටත හා දියයට ආලෝකකරණයසහ හදිසි අවශ්‍යතා සඳහා භාවිතා කරන විදුලි බුබුලු පිළිබඳ අවබෝධය<br>
6. සැලසුම් ඇඳීම<br>
❖ පරිමාණයට අනුව විස්තර සැලසුම් ඇඳීම.<br>
❖ සැලැස්ම පැති පෙනුම හා ඉදිරි පෙනුම හා හරස්කඩ පෙනුම<br>
❖ සේවා සැලසුම්පත්<br>
❖ සංකේත හා මාන<br>
<br>
7 දෙපාර්තමේන්තු චක්‍රලේඛන වලට අදාල කරුණු</td>
</tr>
<tr>
<td>පශු සම්පත් සංවර්ධන නිලධාරි</td>
<td>පරිපාලනය. දෙපාර්තමේන්තු රෙගුලාසි. අනපණත්</td>
<td>I කොටස<br>
• බඩු වට්ටෝරු ලේඛන තඩත්තුව . එළදා ලේඛන තඩත්තුව. තොග පොත් තඩත්තුව හා වෙනත් ලේඛන තඩත්තුව.<br>
• පොතෙත් කපා හැරීමේ ක්‍රියා පිළිවෙල.<br>
• ජාතික මට්ටමෙන් හා පලාත් මට්ටමෙන් දෙපාර්තමේන්තු ව්‍යුහය පරිපාලනය හා ක්‍රියාකරීත්වය.<br>
<br>
II කොටස.<br>
• සත්ත්ව පාලනයට අදාල අණපනත් හා දෙපාර්තමේන්තු රෙගුලාසි.</td>
</tr>
</table>

සකස් කලේ<br>
:අත්සන :<br>
නම :<br>
තනතුර :<br>
දිනය : 2014.01.29

පරීක්ෂා කලේ :<br>
අත්සන :<br>
නම :<br>
තනතුර : 2014.01.30<br>
දිනය :

අත්සන :<br>
( දෙපාර්තමේන්තු ප්‍රධාන)<br>
නම :<br>
තනතුර :<br>
දිනය : 30/1/14<br>
නිල මුද්‍රාව :

උප ලේඛනය 05

විභාග පිළිබඳ ආකෘතිය

01. විභාගයේ නම :- **සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය .**

02. විභාගය පිළිබඳ විස්තර :- ලිඛිත පරීක්ෂණයකි.

| තනතුර | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| පර්යේෂණ සහකාර | 01 පර්යේෂණ හා සැලසුම් මූල ධර්ම | පැය 01 1/2 | 100 | 40 |
| | 02 විශේෂ විෂයානුබද්ධ පත්‍රය | පැය 011/2 | 100 | 40 |
| තාක්ෂණ නිලධාරී | 01 වෘත්තියට අදාල සාමාන්‍ය දැනුම | පැය 011/2 | 100 | 40 |
| | 02 විශේෂ විෂයානුබද්ධ පත්‍රය | පැය 011/2 | 100 | 40 |
| සැලසුම් ශිල්පී | 01 පළමු ප්‍රශ්න පත්‍රය | පැය 03 | 100 | 40 |
| පශු සම්පත් සංවර්ධන නිලධාරී | සත්ත්ව පාලනය හා සංවර්ධනය | පැය 03 | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්.

04. විභාගය අවම වශයෙන් වර්ෂයකට වරක් පවත්වනු ලැබේ.

05. එක් එක් ප්‍රශ්ණ පත්‍රය සඳහා අවම වශයෙන් 40% ක් ලකුණු ලබා ගත යුතුය.

06. විභාගය සඳහා වන විෂය නිර්දේශය :-

| තනතුර | ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශ |
|---|---|---|
| පර්යේෂණ සහකාර | පර්යේෂණ හා සැලසුම් මූලධර්ම | පර්යේෂණ පරමාර්ථ, පරීක්ෂණ ඒකක ගැලපීම, පර්යේෂණ සාවද්‍යතාවය ,සාවද්‍යතා පාලනය, සම්භාව්‍යතාවය, පරීක්ෂණ සඳහා රසායනාගාර සතුන් තෝරා ගැනීම හා සූදානම් කිරීම, විෂ සහිත ද්‍රව්‍යයන් අපහරණය ,පරිසර සිරක්ෂණය |
| | විශේෂ විෂයානුබද්ධ පත්‍රය | 1. ප්‍රජනන අබාධ හා ප්‍රතිදේහ ජනක - මස්තුවේදය, ප්‍රතිදේහ භාවිතය.<br>2. පරපෝෂිත විද්‍යාව වර්ණ ගැන්වීම. - පරපෝෂිත වර්ගීකරණය.<br>3. ක්ෂුද්‍ර විද්‍යාව හා ව්‍යාධි වේදය - රෝපණමාධ්‍යය සෑදීම, ජීවායෙ සංයුතිය පාලනය, ක්ෂුද්‍ර ජිවින් වර්ණ ගැන්වීම, එන්නත්සාර නිෂ්පාදනය හා භාවිතය හා ප්‍රතිදේහ හා ප්‍රතිදේහ ජනක ක්‍රියාකාරිත්වය, ආමූකුලනය.<br>4. කුකුළු රෝග - ක්ෂුද්‍ර ජිවින් වගා කිරීම, වර්ණ ගැන්වීම හා හඳුනාගැනීම. |

| | | |
|---|---|---|
| තාක්ෂණ නිලධාරි | වෘත්තියට අදාල සාමාන්‍ය දැනීම. | (1) ගෘහ නිර්මාණ ඇඳීම<br><br>(අ) දී ඇති දත්ත අනුව ගොඩනැගිලි ඉදිකිරිම සම්බන්ධ සැලසුම් ගෘහ නිර්මාණ ශිල්ප ක්‍රම අනුගමනය කර ඉදිකරිම් සම්බන්ධ සටහනක් පිළියෙල කිරිම සහ ඇස්තමේන්තු පිළියෙල කිරිම .<br><br>(ආ)ව්‍යුහමය ඇඳීම තාප්ප කුළුණු අත්තිවාරම් පිළිබඳ දී ඇති දත්ත අනුව ව්‍යුහමය ඇඳීම. |
| | විශේෂ විෂයානුබද්ධ පත්‍රය | 02 ගොඩනැගිලි ද්‍රව්‍ය පිළිබඳ විස්තර ගොඩනැගිලි ඉදිකිරිම් කටයුතු සඳහා භාවිතා කරන සිමෙන්ති හුණු කොන්ක්‍රීට් ගඩොල් . ලී . සක්කගල් තීන්ත හා වාර්නිෂ් වර්ග ප්ලාස්ටි සහ වීදුරු ගොඩනැගිලි ද්‍රව්‍ය වශයෙන් යොදා ගන්නා ආකාරය<br><br>(ඇ) ගොඩනැගිල්ල සඳහා එම ද්‍රව්‍ය යොදා ගැනිමේ සුදුසු බව පිළිබඳ දැනුම. ප්‍රමාණ පත්‍ර පිළියෙල කිරිම සඳහා අවශ්‍ය වන ද්‍රව්‍ය සහ කම්කරුවන් තීරණය කිරිම.<br><br>03 ගොඩනැගිලි වල විදුලි ජල සැපයුම ආදි සේවාවන් සඳහා දැනුම |
| සැලසුම් ශිල්පි | පළමු ප්‍රශ්න පත්‍රය | 01 ගොඩනැගිලි ඉදිරිකිරිම හා නඩත්තුව<br>❖ පස් වර්ගීකරණය හා භූමි පරීක්ෂාව<br>❖ ගොඩනැගිලි අත්තිවාරම් වර්ග හා භාවිතය<br>❖ තෙත් නිවාරණය.<br>❖ බැමි වර්ග හා භාවිතය-ද්‍රව්‍ය හා ප්‍රමාණ<br>❖ ගොඩනැගිලි ද්‍රව්‍ය තත්ව පරීක්ෂාව හා පිරිවිතර<br>❖ දැව හා වෙනත් දොර ජනෙල් සීලිම් හා වහල<br>❖ දැව වර්ගීකරණය හා භාවිතය<br>❖ වැද්දුම් හා පිරිවැද්දුම්ක්‍රම<br>❖ වහල රාමු සැකිලි(යකඩ හා දැව)<br>❖ .කොන්ක්‍රීට් මිශ්‍රණ<br>❖ වැරගැන්වුම් . තලාද හා තට්ටු<br>❖ ඇතුරුම් වැඩ හා කපරාරු<br>❖ ගොඩනැගිලි නිමැවුම්<br>❖ නඩත්තු වැඩ<br><br>02 ප්‍රමාණ ගැනීම හා ඇස්තමේන්තු<br>❖ ගොඩනැගිලි සැලසුම් මගින් ප්‍රමාණ ගැනීම හාඇස්තමේන්තු පිලයෙල කිරිම.<br>❖ සම්මත පිරිවතර හා සම්මත මැණුම් ගැනීමේක්‍රම<br>❖ අවශ්‍ය කම්කරු ශ්‍රමය හා ගොඩනැගිලි ද්‍රව්‍ය<br><br>03 මූලික බිම මැනීම හා මට්ටම් ගැනීම<br>❖ දම්වැල් මැනුම<br>❖ තලමිතිය - ලෙවලය<br>❖ ලෙවල් පොත හා එහි එක් එක් ක්‍රම වලට පිවූ සැකසීම |

22/20

| | | |
|---|---|---|
| | | 4. ජල සම්පාදනය. ජල අපවහනය. හා පල්දෝරු පද්ධති<br>❖ පයිප්ප වර්ග<br>❖ මනුවලවල් වර්ග<br>❖ උගුල් වර්ග<br>❖ පූතික ටැංකි<br>❖ ගවර වළ<br>❖ උරා ගැනීමේ වළ<br>❖ ජල සැපයුම් . අපවහන හා පල්දෝරු පද්ධතිවලභාවිතා වන උපාංග හා වැල්ව<br>❖ ජල පිරිපහදු ක්‍රම<br>❖ පල්දෝරු පිරිපහදුව<br>5. විදුලි සැපයුම<br>❖ විදුලි පරිපත පිලිබඳ දැනුම<br>❖ පරිපත බිඳීනය<br>❖ විදුලි උපකරණවල ධාරිතාව<br>❖ ධාරාවට අනුව වයර් තේරීම<br>❖ අවශ්‍ය ආලෝක ප්‍රමාණය අනුව විදුලි බුබුලු සැකසීම<br>❖ ඇතුලත. පිටත හා දියයට ආලෝකකරණයසහ හදිසි අවශ්‍යතා සඳහා භාවිතා කරන විදුලි බුබුලු පිලිබඳ අවබෝධය<br>6. සැලසුම් ඇඳීම<br>❖ පරිමාණයට අනුව විස්තර සැලසුම් ඇඳීම<br>❖ සැලැස්ම පැති පෙනුම හා ඉදිරි පෙනුම හා හරස්කඩ පෙනුම<br>❖ සේවා සැලසුම්පත්<br>❖ සංකේත හා මාන<br>7 දෙපාර්තමේන්තු චක්‍රලේඛන වලට අදාල කරුණු |
| පශු සම්පත් සංවර්ධන නිලධාරි | සත්ත්ව පානය හා සංවර්ධනය | 1. ශ්‍රී ලංකාවේ පශු සම්පත් සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය<br>2. දෙපාර්තමේන්තු අභිමතාර්ථ, අරමුණු වැඩසටහන්<br>3. සත්ත්ව පාලන කටයුතු වලට අදාළ සංඛ්‍යාලේඛණ, තොරතුරු, දත්ත, ජාතික හා පළාත් සහා මට්ටමින්<br>4. සත්ත්ව නිෂ්පාදන පරිභෝජන ප්‍රමාණයන්, ආනයන හා අපනයනයන්<br>5. සත්ව පාලන ව්‍යාපෘති හා වැඩසටහන්<br>6. සත්ත්ව පාලන සංවර්ධන කටයුතු වලට අදාළ හා සම්බන්ධ වන රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන හා ඒවායේ ක්‍රියාකාර්ත්වයන් හා දායකත්වය<br>7. කළමනාකරණය, මානව සම්පත් සංවර්ධනය, සන්නිවේදනය<br>8. තාක්ෂණ ප්‍රචාරණ ක්‍රම |

සකස් කළේ
:අත්සන :.......................................
නම :.......................................
තනතුර :.......................................
දිනය : 2014.01.29

පරීක්ෂා කළේ
අත්සන :.......................................
නම :.......................................
තනතුර :.......................................
දිනය : 2014.01.30

අත්සන :.......................................
( දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම :.......................................
තනතුර :.......................................
දිනය : 30/1/14
නිල මුද්‍රාව :.......................................

උප ලේඛනය 06

විභාග පිළිබඳ ආකෘතිය

01. විභාගයේ නම :- **සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කලමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ සැලසුම් ශිල්පී තනතුරේ පුහුණුව අවසානයේ III වන ශ්‍රේණියට පත් කිරීම සඳහා වන පරීක්ෂණය.**

02. විභාගය පිළිබඳ විස්තර :- ලිඛිත පරීක්ෂණයකි.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01 විෂයානුබද්ධ පත්‍රය | පැය 03 | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරන ආයතනයක් මගින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් යන වග. පුහුණු කාලසීමාව අවසානයේදී

05. එක් එක් ප්‍රශ්ණ පත්‍රය සඳහා අවම වශයෙන් 40% ක් ලකුණු ලබා ගත යුතුය.

06. විභාගය සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශ |
|---|---|
| විෂයානුබද්ධ පත්‍රය | 1.මූලික ගෙඩනැගිලි ඉදි කිරීම<br>i අත්තිවාරම් වර්ග<br>❖ ගඩොල් අත්තිවාරම<br>❖ ගඩොල් පාදම් සහිත අත්තිවාරම<br>❖ කළුගල් අත්තිවාරම<br>❖ කළුගල් පාදම් සහිත අත්තිවාරම<br>❖ කොන්ක්‍රීට් අත්තිවාරම<br>❖ කොන්ක්‍රීට් පාදම් සහිත අත්තිවාරම<br>❖ කොන්ක්‍රීට් පාදම් සහිත කළුගල් අත්තිවාරම<br>❖ පාදම හා කණු<br>❖ පයිල් හා අනෙකුත් අත්තිවාරම්<br>ii. රඳවා ගැනීමේ බැමි.<br>iii. තෙත් නිවාරනය<br>iv. පස් වර්ග<br>v. ගොඩනැගිලි ද්‍රව්‍ය<br>vi බැමි වර්ග<br>vii. වහල වර්ග ,උළු වහල , ඇස්බැස්ටස් වහල. තහඩු වහල<br>viii. වැරගැන්වම්. තලාද හා තට්ටු<br>ix. දැව හා වෙනත් භාවිතය<br>x. ගොඩනැගිලි නිමවුම්.<br>xi . නඩත්තු වැඩ<br>2. මූලික ප්‍රමාණ ගැනීම හා ඇස්තමේන්තු<br>❖ සරල ගොඩනැගිලි සැලසුම් මගින් ප්‍රමාණ ගැනීම හා ඇස්තමේන්තු පිළියෙල කිරීම<br>❖ සම්මත පිරිවිතර හා සම්මත මැනුම් ගැනීමේ ක්‍රම<br>❖ අවශ්‍ය කම්කරු ශ්‍රමය හා ගොඩනැගිලි ද්‍රව්‍ය |

3. මූලික බිම මැනීම හා මට්ටම් ගැනීම

- ❖ දම්වැල් මැනුම
- ❖ තලමිතිය - ලෙවලය
- ❖ ලෙවල් පොත හා එහි එක් එක් ක්‍රම වලට පිටු සැකසීම

4. ජල සම්පාදනය. ජල අපවහනය. හා පල්දෝරු පද්ධති

- ❖ පයිප්ප වර්ග
- ❖ මනුවලවල් වර්ග
- ❖ උගුල් වර්ග
- ❖ පූතික ටැංකි
- ❖ ගවර වල
- ❖ උරා ගැනීමේ වල
- ❖ ජල සැපයුම් . අපවහන හා පල්දෝරු පද්ධතිවලභාවිතා වන උපාංග හා වැල්ව
- ❖ ජල පිරිපහදු ක්‍රම
- ❖ පල්දෝරු පිරිපහදුව

5. විදුලි සැපයුම

- ❖ විදුලි පරිපථ පිළිබඳ දැනුම
- ❖ පරිපථ බිඳිනය
- ❖ විදුලි උපකරණවල ධාරිතාව
- ❖ ධාරාවට අනුව වයර් තේරීම
- ❖ අවශ්‍ය ආලෝක ප්‍රමාණය අනුව විදුලි බුබුලු සැකසීම
- ❖ ඇතුලත. පිටත හා දියයට ආලෝකකරණයසහ හදිසි අවශ්‍යතා සඳහා භාවිතා කරන විදුලි බුබුලු පිළිබඳ අවබෝධය

6. සැලසුම් ඇඳීම

- ❖ රේඛා වර්ග හා භාවිතය
- ❖ පරිමාණයට අනුව විස්තර සැලසුම් පිටපත් කිරීම
- ❖ සැලැස්ම පැති පෙනුම හා ඉදිරි පෙනුම හා හරස්කඩ පෙනුම
- ❖ සේවා සැලසුම්පත්
- ❖ සංකේත හා මාන

සකස් කළේ :
අත්සන :
නම :
තනතුර :
දිනය : 2014.01.29

පරීක්ෂා කළේ
අත්සන :
නම :
තනතුර :
දිනය :

අත්සන :
(දෙපාර්තමේන්තු ප්‍රධානි)
නම :
.තනතුර :
දිනය :
නිල මුද්‍රාව :